කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

# සිංහල

සිංහල භාෂා සම්ප්‍රදාය හා කලා ශිල්ප- **SINH 28224**

සෑම කොටසකින්ම අයත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

## 1 කොටස

01. සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ පවත්නා විද්වත් මතවාද සමාලෝචනය කරන්න.

02. සිංහල භාෂාවේ පරිණාමය පිළිබඳ අධ්‍යයනයක දී පුරාතන සිංහල අවධියෙන් ලබාගත හැකි පිටිවහල කෙබඳු දැ යි පරීක්‍ෂා කරන්න.

03. සංස්කෘතික සංස්පර්ශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මධ්‍යතන සිංහල අවධියේ භාෂා ලක්ෂණ සනිදර්ශනව පැහැදිලි කරන්න.

    නැතහොත්

    නූතන සිංහල භාෂාව මත පතිත වූ ඉංග්‍රීසි භාෂාවේ බලපෑම පිළිබඳ සසාධක විමසීමක් කරන්න.

## II කොටස

04. 'ඈ' වර්ණය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, සිදත් සඟරා අක්‍ෂර මාලාව විමසුමට ලක් කරන්න.

05. ''සකුසත් අනුසරෙන්- ඇත ද සදනට ලිඟුබේ
    නොපැනේ වහර වෙසෙසෙක් - පුම ඉතිරි ලිඟු දෙක විනා''
    යන සිදත් සඟරා ලිංග වර්ගීකරණය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

06. විභක්ති පිළිබඳ සිදත් සඟරා විග්‍රහය පැහැදිලි කරමින්, කරණ හා සම්ප්‍රදාන විභක්ති හඳුන්වා දෙන්න.

07. 'සමාස' යන ව්‍යාකරණාංගය හඳුන්වා, සිදත් සඟරාවේ එන විශේෂණ සමාසය නිදසුන් දෙමින් විභාග කරන්න.

## III කොටස

08. ශ්‍රී ලාංකේය ශිල්පකලා ප්‍රබෝධය කෙරෙහි බලපෑ ඓතිහාසික පසුබිම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

09. පොළොන්නරු බුද්ධ ප්‍රතිමාවේ අනන්‍යතා ලක්ෂණ ඇතිවීම කෙරෙහි බලපෑ සංකල්පීය පසුබිම විමර්ශනය කරන්න.

    නැතහොත්

    ''ස්තූපය වූ කලී ශ්‍රී ලාංකික ගෘහනිර්මාණ ශිල්පීන්ගේ විශිෂ්ටතම නිර්මාණය යි'' සාකච්ඡා කරන්න.

10. පහතරට විහාරාරාම ගොඩනැගිලි කෙරෙහි වූ ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායේ බලපෑම පිළිබඳ විමසීමක් කරන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගින්)

******************************